INFORMATION AND COMMUNICATION TECHNOLOGY

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

GRADE 10

10 ශ්‍රේණිය

Pre Engagement Activities And Post Evaluation Activities

පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් හා පසු ඇගයීම් ක්‍රියාකාරකම්

# 9 . දත්ත සමුදාය

## 9.0 තොරතුරු ලබා ගැනීම සඳහා සරල දත්ත සමුදාය නිර්මාණය

**ශිෂ්‍ය කාර්යය -**

- සංවිධානය වූ දත්ත වල එකතුවක් දත්ත සමුදායක් ලෙස හැඳින්වේ.
- දත්ත සමුදායක විශේෂ ලක්ෂණ පවතී.

  දත්ත සමතිරික්තතාවයෙන් වියුක්ත වීම(Data Redundancy),දත්ත වල සංගතතාව පැවතීම(Consistency),නිරවද්‍යතාව වැඩි බව(Accuracy),වලංගුතාවය වැඩි බව (Validity)ආදිය ඉන් කිහිපයකි.

  පෙළ පොතේ පිටු අංක 265 සිට 268 දක්වා හොඳින් කියවා දත්ත සමුදායක විශේෂ ලක්ෂණ අවබෝධ කර ගන්න.

- පහත උදාහරණය සහිත සටහන දෙස බලා සම්බන්ධිත දත්ත සමුදාය නිර්මාණය වන අයුරු බලන්න.

ක්ෂේත්‍ර

රෙකෝඩ

වගු

සම්බන්ධිත දත්ත සමුදාය

ශිෂ්‍ය වගුව

| ඇතුළත් වීමේ අංකය | ශිෂ්‍යයාගේ නම | උපන් දිනය | ක්‍රීඩාවේ අංකය |
|---|---|---|---|
| 1426 | කවිඳු ප්‍රභාෂ්වර | 2005/05/23 | S001 |
| 1428 | මොහමඩ් මලික්කාර් | 2005/02/07 | S002 |
| 1429 | ජනිත් දේවක | 2005/04/15 | S001 |

ක්‍රීඩා වගුව

| ක්‍රීඩාවේ අංකය | ක්‍රීඩාව | ස්ථිර ක්‍රීඩක සංඛ්‍යාව |
|---|---|---|
| S001 | ක්‍රිකට් | 11 |
| S002 | පාපන්දු | 16 |
| S003 | වොලිබෝල් | 06 |

- පෙළ පොතෙහි 272 සිට 274 පිටු කියවා අවබෝධයක් ලබාගෙන ඉහත උදාහරණයට අදාළව ඇති වගු වල ප්‍රාථමික යතුරු වෙන වෙනම ලියන්න.ආගන්තුක යතුරද සොයා අදාල වගුවේ නමද සහිතව ලියන්න.

- දත්ත සමුදාය කළමනාකරණ පද්ධති වල පවතින වස්තූන් මොනවාදැයි පෙළ පොතෙහි පිටු අංක 278 හා 279 පිටු කියවා අවබෝධ කර ගන්න.
- මෙහි දක්වා ඇති මාර්ග ගත ඉගෙනුම් ආධාරක මඟින් මෙම පාඩම තවදුරටත් අධ්‍යනයේ යෙදෙන්න.

**මෙම පාඩමට අදාළව උපකාර ගත හැකි ඉගෙනුම් ආධාරක-**

ඉ තක්සලාව- https://www.e-thaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=563#section-9

e-නැණ පියස - https://www.enenapiyasa.lk/lms/course/view.php?id=453

වෙනත් - https://youtu.be/SexNteh-oQY

සවියෙන් පෙරට - e -ඉගෙනුම් පාසල හොරණ අධ්‍යාපන කලාපය- https://drive.google.com/file/d/1W-FSfJbfmyEVacLBVBmWExJWU32d1Ju9/view

**මෙම පාඩම තුළින් ලබා ගත හැකි ඉගෙනුම් ඵල-**

- සම්බන්ධිත දත්ත සමුදායක ලක්ෂණ පැහැදිලි කරයි.
- දත්ත වගු නිර්මාණය සඳහා සුදුසු ක්ෂේත්‍ර තෝරාගනී.

**ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රමවේදය හා ආකෘතිය**

(i) දත්ත සමුදායක මූලික ලක්ෂණ කෙටියෙන් හඳුන්වන්න.
(ii) ප්‍රාථමික යතුර හා ආගන්තුක යතුර ඔබ කැමති හඳුන්වන්න.
(iii) දත්ත සමුදාය කළමනාකරණ පද්ධති වල පවතින වස්තූන් මොනවාදැයි දක්වා ඒවා කෙටියෙන් හඳුන්වන්න.